ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# නීති ආධාර කොමිෂන් සභාව

## යුක්තිය ඉටු කිරීමෙන් සාමය උදා වේ



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

“අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලිත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමගින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිදු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව.”

Ministry of Justice

# නීති ආධාර කොමිෂන් සභාව

යුක්තිය ඉටු කිරීමෙන් සාමය උදා වේ

**මාර්ගෝපදේශ අත්පොත**

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**

*copyrights@ Legal Aid Commission of Sri Lanka*



## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගනනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදායම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථිර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.

# අපගේ දැක්ම

**යුක්තියට සම ප්‍රවේශයක්**

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

නීතිය ඉදිරියේ සියලු පුද්ගලයන් සමානය යන්න අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම පිළිගත් මූලික අයිතිවාසිකමකි. එහෙත් තමාට සිදුවූ අසාධාරණය වෙනුවෙන් නඩුවක් පැවරීම සඳහා නීතිඥවරයෙකුට මුදල් ගෙවීමට වත්පොහොසත්කමක් නොමැති පුද්ගලයන්ට නීතියේ සාධාරණත්වය සමානව හිමිවේද යන්න ගැටළු සහගත වේ.

දිළිඳු හා අඩු ආදායම්ලාභීන්ට ද නීතියේ සමාන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 1978 අංක 27 දරණ පනතින් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර ප්‍රාදේශීය මධ්‍යස්ථාන 84ක් දක්වා විහිදුනු පුළුල් සේවාවක් එමඟින් සිදු කෙරේ.



## නීති ආධාර ලද හැක්කේ කාහට ද ?

**නොමිලේ නීති උපදේශනය**

ආදායම් තත්ත්වය පරීක්ෂා කිරීමෙන් තොරව ඕනෑම පුද්ගලයෙක්හට ඕනෑම නීති ගැටළුවක් සම්බන්ධයෙන් නීති උපදෙස් නොමිලේ සපයනු ලැබේ.

**නොමිලේ නීතිඥ සේවය**

අධිකරණයේ පෙනී සිටීම සඳහා නීතිඥ නියෝජනය ලබාදීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ආදායම් සීමාව, මාසික ආදායම රු.25,000.00 ට වඩා අඩුවෙන් ලබන පුද්ගලයන් නොමිලේ නීතිඥ සහාය ලැබීමට සුදුසුකම් ලබයි.(මෙම ආදායම් සීමාව කලින් කලට වෙනස් වනු ඇත.)

කෙසේ වෙතත්, කාන්තාවන්, දරුවන්, අපරාධ වින්දිතයින් සම්බන්ධ නඩත්තු ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සම්බන්ධ කරුණකදී මෙම රු. 25,000.00 ක ආදායම් සීමාව සැලකිල්ලට නොගෙන නීතිඥ සහාය ලබා දීමට නීති ආධාර කොමිෂන් සභාව පියවර ගෙන ඇත. එසේම දරුවන් සම්බන්ධ නීතිමය කරුණකදී මව පියා හෝ භාරකරු විසින් දරුවාගේ යහපත පිණිස කරනු ලබන ඉල්ලීමකදී මෙම තත්ත්වය අදාල නොවේ.

## ආදායම් පරීක්ෂණය සිදු කරන්නේ කෙසේ ද ?

අදාල නීති ආධාර ඉල්ලුම්කරු ඉල්ලුම්කාරිය පදිංචිව සිටින ප්‍රදේශයේ ග්‍රාම නිළධාරීවරයා විසින් ඔහුගේ ඇයගේ ආදායම් තත්ත්වය පිළිබඳ සහතික කළ යුතුය. ග්‍රාම නිළධාරීගේ සහතිකය ප්‍රමාණවත් වන අතර අවශ්‍ය අවස්ථාවලදී පමණක් ප්‍රාදේශීය ලේකම්වරයා විමසනු ලබයි.

## නීති ආධාර සැපයීමේදී කාන්තාවන් සහ දරුවන් විශේෂ සැලකීමකට භාජනය වේද ?

ඔව් විශේෂයෙන්ම නඩත්තු නඩුවලදී ආදායම හෝ තරාතිරම නොබලා ඕනෑම කාන්තාවකට හෝ දරුවෙකුට නොමිලේ නීති ආධාර ලබා දීම සිදු කෙරේ.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන්ට සහ දරුවන්ට ආදායම් සීමාව සළකා බැලීමෙන් තොරව නීති ආධාර ලබා දීම සිදු කෙරේ.

## නොමිලේ නීතිඥ සේවය ලබා දෙන්නේ කුමන නඩු සඳහාද ?

### සිවිල් නඩු කටයුතු

#### නඩත්තු නඩු

ස්වාමිපුරුෂයා විසින් සිය බිරිඳ හෝ දරුවන් පෝෂණය නොකර පැහැර හරින අවස්ථාවක බිරිඳ සහ දරුවන්ගේ යැපීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩත්තු නඩු පැවරීම නීති ආධාර කොමිසම විසින් බහුලව සිදු කරන්නකි. ඉල්ලුම්කරුගේ ආදායම් තත්ත්වය සලකා බැලීමකින් තොරව මෙහිදී නීතිඥ සහාය ලබා දෙනු ඇත.

#### රිය අනතුරු වන්දි නඩු

රිය අනතුරුක් සිදුවූ අවස්ථාවක අනතුරට ලක්වූ පුද්ගලයාට පවුලේ යැපෙන්නන්ට වන්දියක් ලබා ගැනීම සඳහා අනතුරු සිදුවූ ප්‍රදේශයේ දිසා අධිකරණයේ වසර දෙකක් ඉක්මවා යාමට කලින් නඩු පැවරීමට ද නීති ආධාර කොමිසම මඟින් නිතීඥ සහාය දීම සිදු කරයි.

#### දික්කසාද/ භාරකාරත්ව නඩු

වෛවාහක වරදක් ඔප්පු කිරීමෙන් දිසා අධිකරණයේ දික්කසාද නඩු ගොනු කිරීමටත් දික්කසාද නඩුවට විත්තිකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටීමටත් දරුවන්ගේ භාරකරත්වය සම්බන්ධයෙන් නියෝග ලබා ගැනීමටත් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී කාන්තාවන් වෙනුවෙන් නීති ආධාර කොමිෂම නීතිඥ සහය ලබා දේ.

#### ඉඩම්/ නෙරපීම්

අඩු ආදායම්ලාභීන්ගේ ඉඩම් සම්බන්ධ නඩු කටයුතුවලට සහ ඔවුන්ගේ දේපලක බලහත්කාරයෙන් රැඳී සිටින්නෙක් ඉවත් කිරීමට හෝ අසාධාරණ ලෙස දේපලකින් ඉවත් කිරීමට ලක්වූ අයෙක් වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥ සහායේ නීති ආධාර කොමිෂමෙන් සැපයේ.

#### මුදල් නඩු සහ අනෙකුත් සිවිල් නඩු

යම් මුදල් ගණුදෙනුවක් හෝ බැංකු ණයක් සම්බන්ධ කටයුත්තක දී අසාධාරණයකට ලක්වූ පාර්ශවයකට සහ කුළී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධ නඩුවකදී අසාධාරණයකට ලක්වූ විත්තිකාර පාර්ශවයකට ඉතා සීමිත අවස්ථාවන් වලදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ අනුමැතිය මත ඉහත කී ආදායම් සීමාවට යටත්ව දිසා අධිකරණයේ පෙනී සිටීම සඳහා නීති ආධාර ලබා දෙනු ඇත.


## අනෙකුත් මහේස්ත්‍රාත් අධිකරණ නඩු

පහත සඳහන් නඩු කටයුතු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටීමට නීති ආධාර කොමිෂන් සභාව මඟින් නොමිලේ නීතිඥ සහාය සලසනු ඇත.

| | | |
|---|---|---|
| නීති සහාය ලැබීමට සුදුසු පුද්ගලයන්ට දේපල සම්බන්ධයෙන් ප්‍රාථමික නඩු විධාන සංග්‍රහයේ 66 වගන්තිය යටතේ නඩුකර ගොනු කිරීමට | 2000 අංක 09 දරණ පනත යටතේ වැඩිහිටි නඩත්තු ඉල්ලීම් මණ්ඩලය මඟින් දෙනු ලබන නඩත්තු නියෝග ක්‍රියාත්මක කර ගැනීම සඳහා ඉල්ලුම්පත් ගොනු කිරීමට | අවශ්‍ය අවස්ථා වල අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට |

## මූලික අයිතිවාසිකම් නඩු කටයුතු

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව පහත සඳහන් අවස්ථාවලදී මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට නීති ආධාර සපයනු ලබයි.



අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සෘජුවම නීති ආධාර කොමිෂමට යොමු කරනු ලබන අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධ පැමිණිලි

නීති ආධාර කොමිෂමට පැමිණෙන (මාසයක කාලය ඉක්මවා යාමට පෙර) අඩු ආදායම්ලාභීන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධ පැමිණිලි සඳහා

## ඇප සම්බන්ධ නඩු

වසරකට වඩා වැඩි කාලයක් ඇප ලබා ගැනීමට නොහැකිව බන්ධනාගාරගතව සිටින නීතිඥ සහාය ලබා ගැනීමට ආදායම් නොමැති සැකකරුවන් (ළමා අපචාර /ස්ත්‍රී දූෂණ චෝදනා ලැබුවන් හැර) සඳහා නීති ආධාර කොමිෂම ඇප ලබා ගැනීමට නොමිලේ නීතිඥ සහාය ලබා දෙනු ලැබේ.

## අභියාචනා නඩු

අපරාධ නඩුවල අභියාචනා හැර අනෙකුත් සියලුම අභියාචනා සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ද රිට් ආඥා නඩුකර සහ ප්‍රතිශෝධන නඩු සඳහා ද කාති අභියාචන මණ්ඩලයේ නඩු සඳහා ද නීති ආධාර කොමිෂම අඩු ආදායම්ලාභීන්ට නොමිලේ නීතිඥ සේවය ලබා දේ.

## අනෙකුත් විනිශ්චයාධිකරණ්හි පෙනී සිටීම

### කම්කරු විනිශ්චය සභා

අසාධාරණ සේවා සමාප්තියක් සිදුවී ඇති අවස්ථාවක නැවත සේවය හෝ වන්දි ලබා ගැනීමට සඳහා මාස 06කේ ඇතුළත කම්කරු විනිශ්චය සභාවල නඩු ගොනු කිරීමට නීති ආධාර කොමිෂම නීතිඥ සහාය ලබා දේ.

### ණය සහන මණ්ඩලය

හදිසි මුදල් අවශ්‍යතාවන් වෙනුවෙන් තම නිශ්චල දේපලක් ණයක් සඳහා උගස් තබා උකස්කර හෝ සින්නක්කර ඔප්පු ලියා ඇති අවස්ථාවක එම ණය මුදල ගෙවා ගැනීමට අපහසුවීම නිසා අසාධාරණ ලෙස දේපලේ අයිතිය ණය හිමි විසින් ලබා ගැනීමට උත්සාහ කරන අවස්ථාවක අසාධාරණයට ලක්වන අඩු ආදායම්ලාභී තැනැත්තන් වෙනුවෙන් නීති ආධාර කොමිෂම නීතිඥ සහාය ලබා දීම සිදු කරයි.

## මීට අමතරව ලබාදෙන නීති ආධාර සේවාවන්

- **ගෙවල් කුලී සමාලෝචන මණ්ඩලය**
- **කම්කරු වන්දි කොමසාරිස්තුමාගේ විනිශ්චය සභාව**
- **ඉඩම් බේරුම් කිරීමේ මණ්ඩලය**
- **පරිපාලන අභියාචනා විනිශ්චය සභාව යනාදී විනිශ්චයාධිකරන**

## නීති ආධාර කොමිෂමේ නඩුවලට අධිකරණයේ පෙනී සිටින නීතිඥවරුන්ට ගාස්තු ගෙවිය යුතුද ?

නැත. රු.200.00 ක ලියාපදිංචි ගාස්තුව හැරුණු විට ඉහත සඳහන් කිසිදු නඩුවක් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම සඳහා නීතිඥවරයෙකුට කිසිඳු ගාස්තුවක් සේවාදායකයකු විසින් ගෙවිය යුතු නොවේ. නඩත්තු නඩුවකදී රු.200.00 ලියාපදිංචි ගාස්තුව ද අය නොකෙරේ.

> "බෙදුම් සහ බූදල් නඩු සඳහා නීති ආධාර කොමිෂන් සභාව ඉතා විශේෂ අවස්ථාවල හැර පෙනී සිටිනු නොලැබේ."

## නීති ආධාර කොමිෂමෙන් සැපයෙන අනෙකුත් සේවාවන්

### දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

නොමිලේ නීතිඥ සහාය ලබා දීමට අමතරව මහජනතාව සහ නීළධාරීන් දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද නීති ආධාර කොමිෂම මඟින් සපයන තවත් සේවාවකි. මේ යටතේ පොදු මහජනතාව පොලිස් නිළධාරීන් ග්‍රාම නිළධාරීන් වැඩිහිටි කමිටු සාමාජිකයන්, මෙන්ම වෙනත් රජයේ නිළධාරීන් ද, පාසැල් සිසුන් ද දැනුවත් කිරීම සිදු කෙරේ.

### මාධ්‍ය මඟින් දැනුවත් කිරීම

මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයන් මඟින් ජනතාව දැනුවත් කිරීමට ද නීති ආධාර කොමිෂන් සභාව කටයුතු කරයි. ඒ යටතේ පුවත් පත් මාධ්‍යයෙන් දැනුවත් කිරීම සඳහා.

දෙසතියකට වරක් අඟහරුවාදා ලංකාදීප පුවත් පත මඟින් "ලංකාදීප නීතියේ සරණ" නමින් පිටුවක් නීති උපදෙස් ලබාදීම සඳහා පවත්වාගෙන යනු ලබයි.




දෙසතියකට වරක් සඳුදා Daily News පුවත් පතේ Legal Aid page යනුවෙන් නීති උපදෙස් පිටුවක් නීති උපදෙස් ලබා දීම සඳහා පවත්වාගෙන යනු ලබයි.

ගුවන් විදුලි සහ රූපවාහිනී මාධ්‍ය මඟින් ද විවිධ නාලිකා සහ විවිධ වැඩසටහන් තුළින් නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන් විසින් ජනතාව නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

## සංවර්ධනාත්මක නීති ආධාර ඒකක ඔස්සේ සමාජයේ විවිධ කණ්ඩායම් සඳහා සේවය සැපයීම

**ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ ඒකකය**

නීති වෘත්තියට අලුතින් පිවිසෙන නීති ශිෂ්‍යන් පුහුණු කිරීම මේ යටතේ සිදු කෙරේ.

**වැඩිහිටි අයිතිවාසිකම් ඒකකය**

ශ්‍රී ලංකාවේ වෙසෙන මිලියන 2කට අධික වැඩිහිටියන් හට දේපල බැහැර කිරීම විශ්‍රාම වැටුප් දරුවන් විසින් නොසලකා හැරීම වැනි ගැටළු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සිදු කරයි. එසේම ගම් මට්ටමින් වැඩිහිටියන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම වැඩිහිටි දිනය සැමරීම ආදිය මේ යටතේ සිදු කරයි.

**විදේශගත ශ්‍රමිකයින් සඳහා නීති ආධාර සැපයීම**

විදේශගත වන ශ්‍රමිකයන්ට අදාල වන නීතීන් පිළිබඳ දැනුවත් කිරීම සහ ඔවුන්ගේ පවුල්වල අය සඳහා නීති උපදෙස් සැපයීම්

**බන්ධනාගර රැඳවියන්ට නීති ආධාර ලබාදීමේ ඒකකය**

බන්ධනාගාර ගත වුවන්ට ඇප ලබා දීමටත් අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම, නිළධාරීන් දැනුවත් කිරීම, බන්ධනාගාර ගත වුවන්ගේ පවුල්වල අයට උපදෙස් සැපයීමත් සිදුවේ.

**කාන්තාවන් සහ ළමුන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය**

විවිධ රැකියාවල නිරතවන කාන්තාවන් මෙන්ම පාසැල් සිසුන් සිය ආරක්ෂාව සහ අභිවෘද්ධිය වෙනුවෙන් පවතින නීතීන් පිළිබඳව දැනුවත් කිරීමත් ජාත්‍යන්තර කාන්තා දිනය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ දිනය ජාත්‍යන්ත ළමා දිනය ආදිය සැමරීම තුළින් ඔවුන් දැනුවත් කිරීමත් අයිතිවාසිකම් පිළිබඳ සංවේදී කිරීමත් මෙමගින් සිදුවේ.

**ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය**

විවිධ ආබාධ තත්ත්වයනගෙන් පෙළෙන තැනැත්තන්ට නීතියෙන් හිමිවී ඇති සුවිශේෂී අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමත් අවශ්‍ය අවස්ථා වලදී නීති ආධාර සැපයීමත් මෙමඟින් සිදු කෙරේ.

**නීතිමය ලිපිලේඛණ සකස් කර දීමේ ඒකකය**

එදිනෙදා ජීවිතයේදී භාවිතාවන උප්පැන්න, මරණ, විවාහ සහතික, ජාතික හැඳුනුම්පත්, යනාදී නීතිමය ලිපිලේඛණ සම්බන්ධ ගැටළුවලදී උපදෙස් දීමත් අවශ්‍ය අවස්ථාවල එම ලිපලේඛණ සැදීමට අවශ්‍ය කටයුතු සිදුකර දීම මෙමඟින් සිදු කෙරේ.

**පාරිභෝගික අයිතිවාසිකම් සුරැකීමේ ඒකකය**

පාරිභෝගිකයකු වශයෙන් තමාට හිමිවන අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සහ එම අයිතිවාසිකමක් කඩ වූ අවස්ථාවකදී පැමිණිලි කළයුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමක් සිදුවේ.

ඉහත සඳහන් නීති ආධාර සේවාවන් දිවයින පුරා පිහිටි අප මධ්‍යස්ථාන 84 මඟින් ලබා ගත හැකිය.

## LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 |
| අක්කරෙයිපත්තු | 067-2279462 |
| අම්පාර | 063-2223495 |
| අනුරාධපුර | 025-2224465 |
| අත්තනගල්ල | 033-2297020 |
| අවිස්සාවේල්ල | 036-2233857 |
| බද්දේගම | 091-2292051 |
| බදුල්ල | 055-2225759 |
| බලංගොඩ | 045-2289099 |
| බලපිටිය | 091-2255753 |
| බණ්ඩාරවෙල | 057-2224733 |
| බත්තරමුල්ල | 011-2877687 |
| මඩකලපුව | 065-2225399 |
| චාවකච්චේරිය | 021-2270882 |
| හලාවත | 032-2222175 |
| දඹුල්ල | 066-2284551 |
| දෙයියන්දර | 041-2268077 |
| දෙනියාය | 041-2271128 |
| ඇඹිලිපිටිය | 047-2230299 |
| ගල්ගමුව | 037-2253290 |
| ගාල්ල | 091-2226124 |
| ගම්පහ | 033-2248804 |
| හම්බන්තොට | 047-2221092 |
| හැටන් | 051-2222390 |
| හිඟුරක්ගොඩ | 027-2245521 |
| හෝමාගම | 011-2748813 |
| හොරණ | 034-2265244 |
| යාපනය | 021-2224545 |
| කඩවත | 011-2922440 |
| කඩුවෙල | 011-2548150 |
| කැකිරාව | 025-2263536 |
| කල්මුනේ | 067-2223710 |
| කළුතර | 034-2222017 |
| මහනුවර | 081-2388978 |
| කන්තලේ | 026-2234521 |
| කැබිතිගොල්ලෑව | 025-2298101 |
| කෑගල්ල | 035-2231790 |
| කිලිනොච්චි | 021-2285618 |
| කුලියාපිටිය | 037-2284611 |
| කුරුණෑගල | 037-2229641 |
| මහියංගනය | 055-2258332 |
| මාහෝ | 037-2275075 |
| මන්නාරම | 023-2222045 |
| මාරවිල | 032-2254443 |
| මාතලේ | 066-2224828 |
| මාතර | 041-2233815 |
| මතුගම | 034-2249262 |
| මාවනැල්ල | 035-2247272 |
| මිනුවන්ගොඩ | 011-2297790 |
| මොණරාගල | 055-2276891 |
| ගල්කිස්ස | 011-2718708 |
| මුලතිවු | 021-2290077 |
| මුයිතූර් | 026-2238777 |
| නාවලපිටිය | 054-2224227 |
| මීගමුව | 031-2281080 |
| නිකවැරටිය | 037-2260203 |
| නුගේගොඩ | 011-2809068 |
| නුවරඑළිය | 052-2235260 |
| පානදුර | 038-2244822 |
| පේදුරුතුඩුව | 021-2260212 |
| පොල්ගහවෙල | 037-2243039 |
| පොළොන්නරුව | 027-2226572 |
| පොතුවිල් | 063-2248485 |
| පුගොඩ | 011-2405333 |
| රත්නපුර | 045-2226899 |
| තංගල්ල | 047-2240122 |
| තඹුත්තේගම | 025-2276259 |
| තිස්සමහාරාමය | 047-2239611 |
| ත්‍රිකුණාමලය | 026-2226328 |
| වාලච්චේනයි | 065-2258349 |
| වව්නියාව | 024-2221863 |
| වලස්මුල්ල | 047-2245566 |
| වැල්ලවාය | 055-2274466 |
| වරකාපොළ | 037-2277075 |
| වාරියපොල | 037-2268199 |
| වැලිමඩ | 057-2244860 |
| මල්ලකම් | 021-2059170 |
| පුත්තලම් | 032-2266636 |
| සියඹලාණ්ඩුව | 055-2279250 |
| දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| LT-බොරැල්ල | 011-2698003 |
| ගලගෙදර | 081-2061025 |
| වත්තල | 011-2935907 |
| හෙට්ටිපොල | 037-2291915 |

0719993618 | 0719994618